## 63 වසරක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තර කළ

# ඉරාන ජනපතිගේ ශ්‍රී ලංකා සංචාරයෙන්...



අගමැති දිනේෂ්ගෙන් මත්තලදී උණුසුම් පිළිගැනීමක්




වර්ෂ 1961දී එවක ලොව 'සිලෝන්' නමින් ප්‍රකට වූ ලංකා දේශය සහ 'පහ්ලවි ඉරාන්' ලෙස හැඳින්වුණු ඉරාන ඉස්ලාමික ජනරජය අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලට මුල පිරීය. ඒ, පාකිස්තානයේ ඉස්ලාමාබාද් අගනුවර පිහිටි ලංකා තානාපති කාර්යාලය ඔස්සේය. එහි ඉදිරි පියවරක් ලෙස 1975දී ඉරාන තානාපති කාර්යාලයක් කොළඹ පිහිටුවනු ලැබූ අතර, ශ්‍රී ලංකාව 1990දී ටෙහ්රාන් නුවර තම තානාපති කාර්යාලය විවෘත කළේය. මහ්මුද් අහ්මදිනෙජාඩ් මහතා 2005දී ඉරනයේ ජනපති ධුරයට පත් වූ පසු ස්වකීය ප්‍රථම විදේශ සංචාරය සඳහා (2008) තෝරාගත්තේ ශ්‍රී ලංකාවය. එසේම හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතාද ඉරානයේ සංචාරයක යෙදුණේය.

මෙලෙස දිගහැරෙන දෙරට අතර මිතු දමේ අග්‍ර ඵලය ලෙස 2010 වසරේදී ආරම්භ කෙරුණු 'උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය' හැඳින්විය හැකිය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ආරාධනාව පරිදි ඉරාන ජනපති ආචාර්ය ඊබ්‍රාහිම් රයිසි මහතා ඊයේ (24) පෙරවරුවේ මත්තල ගුවන්තොටින් මෙරටට සම්ප්‍රාප්ත වූයේ මේ උමා ඔය ව්‍යාපෘතිය ලක් ජනතාවට පවරා දීමට එක් වනු පිණිසය. එහි කටයුතු නිමා වීමෙන් පසු මත්තල සිට ගුවන් මඟින් කටුනා-යක කරා පැමිණි ඒ මහතා ගාලුමුවදොර ජනාධිපති ලේකම් කාර්යාලයේදී ගෞරව බහුමානයෙන් යුක්තව පිළිගනු ලැබී-මෙන් අනතුරුව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවකටද එක් විය.

ඉරාන ජනපතිගේ ශ්‍රී ලංකා සංචාරයේ විශේෂ අවස්ථා කිහිපයක් කැමරා ඇසෙහි සටහන් වූයේ මෙලෙසිනි.

*ඡායාරූප - ජනාධිපති මාධ්‍ය අංශය සහ සුලෝචන ගමගේ*



බුලත් හුරුල්ලක් දී පිළිගත් දරුවාට පළ වූ ඉරාන ජනපතිගේ ළබැඳි සෙනෙහස



මත්තල ගුවන්තොට විශේෂ අමුත්තන්ගේ පොතේ සමරුවක් තබමින්



උමාඔය ජලාශ පරිශ්‍රයට සපැමිණි අවස්ථාව



සමරු ඵලකය නිරාවරණය කිරීමට එක් වී



ජලාශ පරිශ්‍රයේ උත්සව සභාවේදී





ජනාධිපති ලේකම් කාර්යාලය අබිමුවදී ජනපති රනිල් විසින් පිළිගනු ලබමින්



ශ්‍රී ලංකා රජයේ ප්‍රධානීන් හඳුනාගනිමින්

හමුදා උත්තමාචාරය පිළිගන්නා දෙරට ජනපතිවරු



අශ්වාරෝහක බළඇණිය පෙරටු කරගත් රිය පෙරහරින් සිදු වූ සම්ප්‍රාප්තිය



දෙරටේ ජනාධිපතිවරු ද්විපාර්ශ්වික සාකච්ඡාවලට එක් වෙමින්